# "සමාජ සුරක්ෂිතභාවය කෙරෙහි බෞද්ධ ආර්ථිකයේ උපයෝගීතාව" විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. චන්දිමා හේමමාලි[1]

## හැඳින්වීම

හොඳින් හඳුනා ගත් මානව සමූහය සමාජය යි. සමාජය නිර්මාණය කරන්නේ පුද්ගලයා යි. සමාජ ක්‍රියාකාරීත්වයේ ඒකාය පෞද්ගලික ක්‍රියාව යි. පුද්ගලයාගේ ජීවන ක්‍රියාදාමය පවුල නම් වූ සමාගමයත් සමඟ සුහද වපසරියක් පවත්වාගත යුතු යි. එය බෞද්ධ ආර්ථික දර්ශනයට වැදගත් වෙයි. වත්මන් ලොව සඞ්කීර්ණ වූ භයඞ්කර ගැටලුවලට මුහුණ දෙයි. සුහදශීලි මිනිස් සබඳතාවක අඩිතාලම වන්නේ යහපත් ආර්ථිකය යි. පවුලක පැවතිය යුතු සුරක්ෂිතභාවය අඩපණ වන්නේ පවුල් ගැටුම් හේතුවෙනි. රටක ඇතිවෙන ගැටුම් මහජන සුරක්ෂිතභාවය බිඳියි. ආර්ථිකය සමාජ සුරක්ෂිතභාවය පදනම යි. සමාජ ක්‍රියාකාරීත්වය හා බැඳුණු ක්ෂේත්‍රයන් අතුරින් ආර්ථිකය ප්‍රමුඛ වෙයි. යහපත් ආර්ථිකයක් ඇති රටක අර්බුද හා ගැටුම් අවම යි. ආර්ථිකවිද්‍යාවේ පදනම වන්නේ හිඟකම යි. එය නූතන ආර්ථිකයේ පදනම යි. අසීමිත අරමුණු හමුවේ මතුවෙන හිඟකම පිළිබඳ මනෝවිද්‍යාත්මක විවරණයක් අග්ගඤ්ඤ සූත්‍රයේ එයි. පුද්ගලයා හා සබැඳුණු සෑම අංශයක ම පරාවර්තනය ඇති වන්නේ ආර්ථිකමය වශයෙන් ඇති වූ මෙම හිඟකම නිසා බව එහි එයි. සුරක්ෂිත සමාජයක් උදෙසා ආර්ථිකයේ වැදගත් බව බුදුදහම කියයි. පුද්ගල සමාජයක ශිෂ්ට බව හෝ අශිෂ්ට බව තීරණය කරන්නේ ද ආර්ථිකය යි.

## පර්යේෂණ අරමුණ/පර්යේෂණ ගැටලුව

වත්මන් ලොව ඇති වී තිබෙන විවිධ සමාජ ගැටලුවලට ප්‍රධාන හේතුව වන්නේ ආර්ථිකයේ පවතින විෂමතාව යි. මෙම විෂමතාව සමාජ සුරක්ෂිතභාවය බිඳ හෙළීමට හේතුවක් ව තිබේ. බෞද්ධ ආර්ථික දර්ශනය තුළ ඉගැන්වීම් සමාජ සුරක්ෂිත බව සාධනය කිරීමෙහි ලා කොතෙක් දුරට උපයෝගීතාවෙන් යුක්ත වන්නේ ද යන්න මෙහි මුඛ්‍ය අරමුණ වෙයි.

සමාජ සුරක්ෂිතභාවයට ඉවහල් වන්නා වූ බෞද්ධ ආර්ථික නිර්ණායකයන් මොනවා ද? එකී නිර්ණායකයන් කොතෙක් දුරට සුරක්ෂිතභාවය තහවුරු කිරීමට සාධක වන්නේ ද? යන්න පර්යේෂණ ගැටලුවෙහි තබා මෙම පර්යේෂණය සිදු කරන ලදී.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයේ ප්‍රධාන ක්‍රමවේදය ලිඛිත මූලාශ්‍රය උපයෝගී කොට දත්ත රැස්කිරීම යි. එහි ලා පාලි ත්‍රිපිටක ග්‍රන්ථ, ද්විතීයික මූලාශ්‍රය ද අතිරේක වශයෙන් අන්තර්ජාලය ද භාවිත විය. දත්ත රැස් කිරීමත් අනතුරු ව දත්ත විශ්ලේෂණයත් එමඟින් නිගමනයන්ට එළඹීමත් සිදු විය.

[1]. *Chandima18dissanayake@gmail.com*

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල/පර්යේෂණ නිගමන**

මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් සාකච්ඡා කරන්නේ පුද්ගලයා මුල් කොට සැකසෙන පවුලේ ආර්ථිකය සමාජ සුරක්ෂිතභාවය කිරිමෙහි ලා උපයෝගී වන්නේ කෙසේ ද? යන්න පමණි. හඳුනා ගත් නිර්ණායකයන් වන්නේ ධන නිෂ්පාදන ක්‍රම, සුරක්ෂිතභාවය, පරිභෝජනය හා තැන්පතු ය. වත්මන් ලොව භයඞ්කාර වූ ගැටලුවලට මුහුණ දෙයි. මිනිස් අරමුණු අසීමිත ය. ශක්තිමත් සමාජ පදනමකට අවශ්‍ය වන්නේ උසස් ආර්ථිකය යි. කැම්-බීම්, ඉඳුම්-හිටුම් ආදිය සැකසෙන්නේ ආර්ථිකය තුළ යි. දියුණු නො දියුණු සමාජය දක්වා ම පුද්ගල අවශ්‍යතා සිදු වන්නේ ආර්ථිකයට අනුකූලව යි. නිෂ්පාදනයේ දී වැදගත් සාධකය ශ්‍රමය යි. සමාජ සුරක්ෂිතභාවය සුරකින නිෂ්පාදන කිහිපයක් බුදුදහමේ එයි. ධාර්මික ව සම්මාදිට්ඨියෙන් අනුමත ක්‍රමවලින් ධනය සෙවිය යුතු බව බුදුදහම කියයි. නිෂ්පාදනයේ දී පුද්ගලයා විරතිය ද සමාදානය ද අනුගමනය කළ යුතු යි. නො කළයුතු වෙළඳාම් තුළින් අවධාරණය වන්නේ එය යි. බලවත් රාජ්‍ය අවි ආයුධ නිෂ්පාදනය හා ඒවා වෙළඳාම් කිරිම සඳහා උචිත වෙළඳපොළ හදන්නේ විවිධ ආර්ථික ඝාතන සැලසුම් හා දේශපාලන වියවුල් තුන්වන ලෝකයේ රටවල ඇති කිරීම මඟිනි. නිරතුරුව ම යුධමය වාතාවරණයක් පවතින රටවල දරිද්‍රතාව, විරැකියාව, මත්ද්‍රව්‍ය ජාවාරම, පාතාලය ආදී ඉස්මතු වෙයි. එවැනි සමාජවල සුරක්ෂිතභාවයක් නැත. අසල්වැසි රටෙහි නිරතුරුව ම ස්ත්‍රී දූෂණ හා ගැහැණු දැරිවියන් අපයෝජනය කොට ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරිම සුලභ ය. මෙවැනි අපරාධ සිදු කරන්නේ ආර්ථික අවපීඩනයට ලක් පිරිස් විසිනි. සෝමාලියාව, ඉතියෝපියාව, එවැනි රටවල් ය. සමාජහරණයට ලක් වූවන් බිහිවීමට හේතු වෙයි. ධනය පමණක් නො ව සෞඛ්‍ය හා සාමය විනාශ වෙයි. විරමණය තුළත් නොකළයුතු වෙළඳාම් තුළත් ධන විනාශ මුඛ තුළත් මෙම කරුණු දක්වා තිබීමෙන් පෙනෙන්නේ සමාජ සුරක්ෂිතභාවය කෙරෙහි එමගින් ඇතිවෙන බලපෑම කොතෙක් ද යන්න ය. චක්කවත්තීසීහනාද සූත්‍රයේ මිනිසා අයහපත් හා දුරාචාරවලට යොමුවීම නිසා ආර්ථික පරිහානියත් ආර්ථික පරිහානිය නිසා සමාජ සුරක්ෂිතභාවයත් බිඳී ගිය ආකාරය සමාජවිද්‍යාත්මකව දක්වා තිබේ. **"අනාකුලා ච කම්මන්තා"** උතුම් කරුණක් වූයේ එනිස යි. සමාජ සුරක්ෂිතභාවය ඇතිවීමට ධන උපාර්ජනයේ දී සර්වාර්ථසාධනයට යොමු විය යුතු යි. පංචබලි සඞ්කල්පයෙන් කියන්නේ එය යි. රටක, දේශයක ආදායම් ව්‍යාප්තියක ස්වරූපය හඳුනා ගැනීමේ වැදගත්කම ද පෙන්වයි. පසාකාරයෙන් උපයන ධනය එක සමාන නො වෙයි. උපයන ධනය විවිධ වීම හේතුව යි. ආදායම් ප්‍රමාණය තුළ විවිධත්වයක් ඇතිවීමට හේතු වන්නේ මිනිසාට උපතින් හිමි වන ආර්ථික මට්ටම, බුද්ධිය හා පරිසරය යි. මෙම අසම වූ විෂමතාව පාලනය කිරිමේ දී ඇසු පිරූ තැන් ඇති බව හා මනාව ප්‍රගුණ කරන ලද ශිල්ප ශාස්ත්‍රයන්ගෙන් යුක්තවීම යන උතුම් කරුණු කෙතරම් කාලෝචිත දැයි මට සිතේ. වත්මන් මිනිසා ධනය උපයන්නේ නො දැහැමි හා සැහැසිකම් මඟිනි. සමහර අවස්ථාවල දී දැහැමි ව ධනය ඉපැයීමේ දී සැහැසිකම් ද යොදා ගැනීමට සිදු වෙයි. රාසිය සූත්‍රයේ විවරණයන් කොතෙක් දුරට සමාජවිද්‍යාත්මක දැයි අවබෝධ වන්නේ ධාර්මිකව ධනය ලැබීම කොතරම් අපහසු ද යන්න යි. සැහැසිකම් දුරාචාර වර්ධනය වන සත්වඝාතන, මත් ද්‍රව්‍ය හුවමාරුව ඇති සමාජ ආර්ථික වටපිටාවක ජීවත්වන පුද්ගලයාගේ පෞරුෂය සැකසෙන්නේ ද එකී පරිසරයට උචිත ලෙස යි. උපතින් ම උසස් බුද්ධියක් ඇති ව උපත ලැබුව ද මෙවැනි පරිසරයක ඉපදුණු දරුවාගේ පවා කුසලකර්මයන් නිලීන ව ගොස් යටපත්

ව තිබෙන අකුසලකර්මයන් ඉස්මතු වීමේ ප්‍රවණතාව ඉතා ඉහළ ය. සුදුසු ප්‍රදේශයක ඉපිද ජීවත් වීම ම උතුම් කරුණක් වන්නේ ඒ නිසා ය. තමා රැකීම මෙරමා රැකිම යි. මෙරමා රකින්නේ තමා ද රැකෙයි. තමා අන් අය රකියි. අන් අය තමා රකියි. ශිල්පයෙහි ද ලාභයෙහි ද තමා අන් අයත්, අන් අය තමාවත්, එකිනෙකාව රකියි. එම සමාජය වඩාත් උසස් තත්ත්‍වයට පත් වෙයි. ආර්ථිකය හා සමාජ පුද්ගල සබඳතාවේ ඓක්‍යයන් වන ස්වාර්ථය හා පරාර්ථය අතර පවතින නො බිඳිය හැකි සබඳතාව එය යි. වැහි බින්දු නැති හිස් වළාකුළක් මෙන් නො ව සියලු තන්හි වසිනා වැසිවළාවන් සේ තම උපයා ගත් ධනය තමා අවට සිටින සතා සිව්පාවුන්ට ද තමා අයත් සමාජ පරිසරයට ද උපකාරී වන අන්දමින් ස්වකීය ආර්ථික පරිභෝජනය මෙහෙයවයි. විශේෂයෙන් ම නිදහස් තරඟකාරී වෙළඳපොළ ක්‍රමය ක්‍රියාත්මක වන වෙළඳපොළේ බලවේග මඟින් තීරණය කරන නිෂ්පාදන මට්ටම, හුවමාරු ප්‍රමාණය සහ මිල ගණන්, කාලය ප්‍රදේශය වැනි සාධක හේතුවෙන් වෙනස් වේ. පංචබලි සඞ්කල්ප දේශනාව තුළ එලෙස ඇතිවිය හැකි සමාජ අර්බුද හා ගැටලුකාරී තත්ත්‍වයන් මනාව අවම කොට යහපත් සමාජ ආර්ථික වපසරියක් නිර්මාණය කළ හැකි ය යන්න මාගේ නිගමනය යි. එය කාලීන යි. බෞද්ධ ආර්ථික න්‍යායන් ප්‍රායෝගිකත්‍වයෙන් යුතු යි. නන්දාමාලනිය ගයන **"ඉදෙන්නට හැකිනම් බතක් වී.... බතක් නො ඉදෙන පැලක රහසින්"** යන්න සුරක්ෂිත සමාජයක පදනම නො වේ ද?

**ප්‍රමුඛ පද:** වෙළඳපොළ, ආර්ථිකය, හුවමාරු ප්‍රමාණය, පංචබලි සඞ්කල්ප, සමාජ සුරක්ෂිතභාවය

**මූලාශ්‍රය**


- **අඞ්ගුත්තරනිකාය** II, III, IV, V. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ඛුද්දකනිකාය.** (2006). **පෙතවත්ථුපාළිය.** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **දීඝනිකාය** III. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සංයුත්තනිකාය** IV. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- කරුණාරත්න, එච්.ඩී. (2009). **ප්‍රායෝගික ආර්ථිකවිද්‍යාව.** නුගේගොඩ: නියෝ ග්‍රැෆික්ස්.